**පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017**

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2013 මැයි 08 දින එළඹි අංක එස්ආර්අයි 43576 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) (ii) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ඉහත සඳහන් ව්‍යාපෘති ගිවිසුම යටතේ 2013 මැයි 08 දින එළඹි අංක 2892 එස්ආර්අයි සහ 2893 එස්ආර්අයි දරන ණය ගිවිසුම් අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 - කොටස සිට 06 - කොටස දක්වා කොටස් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වගකීම දරන අතර ව්‍යාපෘතියේ 07 කොටස ක්‍රියාත්මක කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගකීම දරයි. ව්‍යාපෘතියේ 01 -කොටස සිට 06 - කොටස දක්වා කොටස් යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්තිය සැපයීම වැඩිකිරීම හා විදුලිබලය බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසවන්තභාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 25,240 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර ඉන් රු.මිලියන 16,595.30 කට සමාන එජඩො මිලියන 131.50 ක් හෙවත් සියයට 66 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය 2019 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා

ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම හැර, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛයට අනුව මූල්‍ය වර්ෂය අවසන්වී මාස 3ක් ඇතුළත ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම අවශ්‍යවේ. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 19 දින විගණනයට ඉදිරිපත්කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාල බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු එකතුව රු. මිලියන 66.30 ක් ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණු අතර එම එකතුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියෙන් රු. මිලියන 123.71 ක පිරිවැයක් දරා ප්‍රසම්පාදනය කරන ලද මෝටර් රථ 9 ක් ලංකා විදුලිබල මණ්ඩලයට මාරුකරන ලද අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එම පිරිවැය දේපල පිරියත හා උපකරණ සහ කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණු බව නිරීක්ෂණය විය.

### 2.2.3 නොසැසඳූ ශේෂ

---------------------

2017 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව රු. මිලියන 12,858 ක් වූ ණයවල මුළු වියපැහැදම, එදිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනුරූපී වියපැහැදම් ශේෂය වූ රු. මිලියන 12,512 සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යායන, වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 131.50 | 16,595.30 | 6,033.00 | 36.56 | 5,544.00 | 82.52 | 12,512.00 |
| ශ්‍රීලංර | 68.50 | 8,644.70 | - | - | - | | - |
| ලංවිම | - | - | 560.00 | 3.57 | 542.00 | 12.08 | 1,832.00 |
| එකතුව | 200.00 | 25,240.00 | 6,593.00 | 40.13 | 6,086.00 | 94.60 | 14,344.00 |

## 3.2 භෞතික ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සපයන ලද තොරතුරුවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර සිට මන්නාරම දක්වා නව විදුලි සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම සියයට 89 ක භෞතික වැඩ ඉටුකර තිබුණි. කෙසේ වුවද මන්නාරම ග්‍රිඩ් උප පොලෙහි ඉදිකිරීම් වැඩ විෂය පථය වෙනස්වීම හේතුවෙන් මූලික අදියරේ වැඩ ඉතිරිව තිබුණි.

(ආ) විදුලි සම්ප්‍රේෂණ රැහැන් එලීමේ කටයුතු ප්‍රමාදවීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ග්‍රිඩ් උප පොළෙහි සහ තුල්හිරිය ග්‍රිඩ් උප පොළෙහි වැඩිදියුණු කිරීම්වල ඉදිකිරීම් වැඩ සම්පූර්ණකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රවේශ පහසුකම් ලබා ගැනීමේදී ඇතිවූ ආරාවුල් හේතුවෙන් බියගම, සපුගස්කන්ද සහ කොළොන්නාව ග්‍රිඩ් උප පොළවල්වල බ්‍රේකස් සුවිච සවිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 වන විටත් අවසන්කර නොතිබුණි. අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අනුමැතිය ලැබීම ප්‍රමාදවීම, මුලු ගමන්මඟ සඳහා විකල්ප සහ මහජන විරෝධතා යනාදිය හේතුවෙන් තුල්හිරිය සිට කෑගල්ල, පාදුක්ක සිට අතුරුගිරිය සහ කොළොන්නාව සිට අතුරුගිරිය දක්වා වූ සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ භෞතික කාර්ය සාධනය ඉලක්කවලට පසුපසින් පැවතුණි.

(ඇ) ව්‍යාපෘතිය විසින් සම්ප්‍රේෂණ රැහැන් එලීම පිළිබඳ ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත සන්නිවේදනය කිරීම සම්බන්ධව මනා අවධානයක් නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස පාදුක්ක හරහා පොල්පිටිය සිට පන්නිපිටිය දක්වා සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ වැඩ ඉලක්ක වලට පසුපසින් පැවති බව නිරීක්ෂණය විය. ඉඩම් අයිතිකරුවන් විසින් සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමට විරුද්ධව ඇතිවූ මහජන විරෝධතා හා නඩු 4 ක් ගොනුකර තිබීම හේතුවෙන්

මෙම කාර්යය සඳහා මාගම්මන පාදුක්ක ඇතුළු ස්ථාන 13 ක ඉඩම් අත්පත්තර ගැනීමට නොහැකි වී තිබුණි.

3.2.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

සැලසුම්ගත කාලය තුළ ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ණය සපයන ලද නියෝජිත ආයතන විසින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4.71 ක බැඳීම් ගාස්තු අයකරගෙන තිබුණි.

3.2.2 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ සිවිල් වැඩවල නිරත කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්ය මණ්ඩලය පදිංචි කරවීමේ කාර්ය සඳහා කහටගස්ඩිගිලිය, කැබිතිගොල්ලෑව, පොතුවිල්, අක්කරෙයිපත්තු සහ කිරිබත්කුඹුර ප්‍රදේශවලින් නිවාස 5 ක් කුලියට ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ප්‍රදේශයේ වර්තමානයේ පවතින වෙළඳපොල වටිනාකමට ඉතා වැඩි මුදලකට එනම් මාසිකව එක් නිවාසයකට රු.350,000 බැගින් වූ රේටයකට හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එකතුව රු. මිලියන 12.95 ක් ඒ සඳහා ප්‍රතිපූරණය කරගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රසම්පාදනය කරන ලද මෝටර් රථ 11ක් මාසික ධාවන සටහන් වෙනුවට ව්‍යාපෘතියේ වැඩබිම් ඉංජිනේරුවන් විසින් සහතික කරන ලද ගමන් සටහන් පත්‍ර විගණනයට ඉදිරිපත්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු. මිලියන 27.23 ක ඉන්ධන හා නඩත්තු පිරිවැය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හා පිළිගැනීමට නොහැකි විය.

3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියලුම ආධාර ලබාදුන් ව්‍යාපෘතිවල අධීක්ෂණය සහ වගකීම දරන අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) වෙනුවට කොටස් 4කින් සමන්විත ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය සහ මෙහෙයවීම විදුලබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන්ගේ අදහස් යටතේ සිදුකර තිබුණි.

(ආ) ව්‍යාපෘති ගිවිසුමේ 2.09(අ) වගන්තිය අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ව්‍යාපෘතිය සඳහා වෙනම ලෙජර් ගිණුම් භාවිතාකර නොතිබුණි.